වැල්වටිතුරේ නගර සභාව

යාපනය දිස්ත්‍රික්කය.

-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 11 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 02 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව වැල්වටිතුරේ නගර සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට වැල්වටිතුරේ නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

වත්කම්, ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම | 01 | 805,000 | 01 | 70,000 | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 229,257 | - | - |
| වර්ගීකරණ දෝෂ | - | - | - | - | 01 | 7,000 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.511,546 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.951,768 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.275,965 ක් විය.

2.2 මූල්‍ය පාලනය

අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත සහ තථ්‍ය ආදායම් අතර රු.4,684,991 ක් වූ වෙනසක් ද අයවැයගත සහ තථ්‍ය වියදම් අතර රු.3,975,747 ක් වූ වෙනසක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟ |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 775 | 773 | - |
| බදු කුලි | 3,565 | 5,556 | - |
| බලපත්‍ර ගාස්තු | 307 | 433 | - |
| වෙනත් ආදායම් | 20,368 | 22,938 | 11,277 |
| එකතුව | 25,015 | 29,700 | 11,277 |

### 2.3.2 ආදායම් අහිමි විම

විදුලිබල සැපයිම 1999 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයට භාරදි තිබුණි. කෙසේ වුවද, සභා බල ප්‍රදේශය තුල වීදි ලාම්පු නඩත්තු කිරිම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබිය යුතු රු.136,885 ක මුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබුණු බැවින් සභාවට ආදායම් අහිමිවිමක් සිදු වි තිබුණි.

2.3.3 උසාවි දඩ

---------------

මහේස්ත්‍රාත් උසාවියෙන් අයවිය යුතු රු.4,624,750 ක් වූ උසාවි දඩ සහ දණ්ඩන ආදායම් සහ ලැබිය යුතු මුදල් ලෙස බිල්කර තිබුණු නමුත් එම මුදල් අයකර ගැනිම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | මුදල |
|---|---|
| | රු. |
| 2011 | 867,250 |
| 2012 | 3,757,500 |
| | 4,624,750 |
| | ======== |

2.3.4 මුද්දර ගාස්තු

----------------

(අ) 2012 ජුනි 30 දක්වා වූ මුද්දර ගාස්තු රු.2,000,025 ක් ආදායම් සහ ලැබිය යුතු මුදල් ලෙස ගිනුම් ගතකර තිබුණ නමුත් ඒවා අයකර ගැනිම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2012 ජුලි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළ මුද්දර ගාස්තු පිළිබඳ විස්තර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලබාගෙන නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

2.4.1 උපයෝජනය නොකළ භෞතික සම්පත්

------------------------------------------------

රු.1,520,650 ක් වටිනා රෝද දෙකේ ට්‍රැක්ටර් 02 ක් සහ ඡායා පිටපත් යන්ත්‍රයක් වර්ෂ 02 කට අධික කාලයක් තිස්සේ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

2.4.2 සමික්ෂණය නොකළ වත්කම්

-------------------------------------.

පොත් අගය මත ගිණුම් වල දක්වා ඇති 2012 දෙසැම්බර් 31 දිනට වූ පහත සඳහන් වත්කම්, සමික්ෂණ මණ්ඩල වාර්තා මගින් සනාථ කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තර | මුදල |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 12,644,577 |
| වට්ටෝරු විෂයයන් | 341,704 |
| | --------------- |
| | 12,986,281 |
| | ========= |

2.4.3 වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා

---------------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය

(අ) සමීක්ෂණය සඳහා 2012 සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ පොත් 177 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුල අර්ථවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) භෞතික හරිවැරදි බැලීම් අනුව සීලින් පංකා සංඛ්‍යාව 42 ක් වූ අතර තොග ලේඛනය අනුව එම සංඛ්‍යාව 19 ක් විය. ඒ අනුව සීලින් පංකා 23 ක් තොග ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.

2.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව. | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | --------------------------------------------- | | ---------------------- |
| (අ) | 1939 නගර සභා ආඥාපනත- | | |
| (i) | V පරිච්ඡේදයේ 168 වගන්තිය | - | ගෙවන ලද එක් එක් අත්තිකාරම සඳහා අත්තිකාරම් ලේඛනයෙහි සටහන් යොදා නොතිබුණි. |
| (ii) | V පරිච්ඡේදයේ 172 වගන්තිය | - | සභාව විසින් ප්‍රධාන ලෙජරය සසඳා නොතිබුණු අතර මාසිකව යාථාවත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | VI පරිච්ඡේදයේ 176 වගන්තිය | - | තැන්පතු ලේඛනයේ දැක්වෙන ශේෂය මාසිකව ප්‍රධාන ලෙජරයේ ශේෂය සමග සසඳා නොතිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | - | 2011 වර්ෂයේදි අයකරන ලද රු.4,800 ක් වූ එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශණය කර නොතිබුණි. |

2.6 කොන්ත්‍රාත් පරිපාලනය
------------------------------

(අ) අත්හැර දමන ලද ව්‍යාපෘති
---------------------------------

සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කළයුතු රු. 1,700,000 ක් වටිනා සීරුවිල් ජලාපවහන ව්‍යාපෘති අත්හැර දමා තිබුණි.

(ආ) කොටසක් නිමකළ ව්‍යාපෘති
--------------------------------

මායිලිරනායි සුසාන භූමියේ තාප්පය ඉදිකිරිම සඳහා ඇස්තමේන්තුගත වාය රු.400,000 ක් වූ අතර මේ සම්බන්ධයෙන් මේ වන විට රු.58,046 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වුවද ගම්වැසියන්ගේ විරෝධතා හේතුවෙන් වැඩ අත්හැර දමා තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා
---------------------------------

සභාව විසින් ඉටුකරන ලද ප්‍රාග්ධන වැඩවලට අදාළ රු.195,051 ක් වූ විවිධ ණයගැතියන් වර්ෂයකට අධික කාලයක් නිරවුල් නොකර පැවතුණි.

3. පද්ධති සහ පාලන

------------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) මානව සම්පත්

(ඉ) පරිත්‍යාග

(ඊ) වාහන උපයෝජනය

(උ) විවිධ තැන්පතු

(ඌ) අයවැය